සිංහල සිනමාව සහ මම 1

චන්දන ගුණසේකර
එක්සත් රාජධානිය

මේ කතාව මට පටන් ගන්න වෙන්නේ 1976 වසරේ එක්තරා දිනෙක සොඳුරු සන්ධ්‍යා යාමයකින්. එදිනත් සුපුරුදු පරිදි රාස්සීගේ අව්ව අපේ ගෙදර වහලට මුවා වෙද්දී මම නංගී සමඟ වත්තේ දුව පැන සෙල්ලම් කරමින් හා දුවිලි නාමින් පසුවූයෙමි.

හදිසියේම වාගේ ගෙදර පැමිණි අපේ තාත්තා කඩුල්ල පැන වත්තට ඇතුළුවන අතරම "සුද්දා චිත්‍රපටියක් බලන්න යන්න ඉක්මනට ඇඳුමක් දාගන්න" යැයි කීවේය. මා පැහැයෙන් නංගී හෝ අම්මා මෙන් සුදු නොවූවත් තාත්තාගේ ලෝකයේ මම සුද්දාම විමි. දැන් මගේ පුතාට මා සුද්දා යැයි අමතන සෑම මොහොතකම තාත්තා පිළිබඳ සුන්දර සිතිවිල්ලකින් හදවත කිතිකැවී යන්නේ මටත් නොකියාමය.

තාත්තාගේ ආරාධනයෙන් කුල්මත් වූ මා මිටින් හල කුරුල්ලෙකු සේ වහා සැරසී නතර වූයේ තාත්තාගේ බයිසිකලයේ බාර් එක මතිනි. තාත්තා බොහෝ වේලාවට බාර් එක මත කොට්ටයක් තබා නංගි හා මාද එහි හිඳුවා අටමස්ථානය අවට හැන්දෑ ජාමේ කරක් ගැසීම පුරුද්දක් කොට සිටියේය. එම ගමන් ගැන සුන්දර මතකයත් සමඟ එක දිගට වාඩි වී ගොස් කකුල් හිරිවැටුණ විට ඇවිදගැනුමට නොහැකිව විදි වේදනාවන් හා පාදය බයිසිකලයේ ඉස්සරහ රෝදයේ ස්පෝක් අතර සිරවීමෙන් විදි වේදනාවන්ද සම සමව මගේ සිහියට එයි.

ඉතිං තාත්තා මා එදා රැගෙන ගියේ අනුරාධපුරයේ සිත්තම්පලම් සිනමා ශාලාවේ තිරගතවූ හුලවාලි සිනමා පටය නැරඹීමටයි. අනුරාධපුර නගරයේ එවකට සිනමාහල් තුනක් තිබිණි. ඒ අතරින් යම් සුවපහසුවකින් යුතු සිනමා හල වූයේ සිත්තම්පලම් සිනමා හලයි. එය ගඩොලින් බැඳ නවීන පන්නයටම සාදා තිබූ අතර බැල්කනියක් හා පහත මාලයේ පිටුපසට වන්නට බොක්ස් කිහිපයකින්ද සන්නද්ධ විය. ඒ කාලයේ එම බොක්ස් නැත්නම් කුටි පවුලකට නිදහසේ චිත්‍රපටය නැරඹීම සඳහා වෙන් කර තිබුණද පසු කාලයේ පෙම්වතුන් ඒවා තම තමන්ගේ ඕනෑ එපාකම් සතපවා ගත් තාවකාලික කුටි වූ බැව් මා දැනගත්තේ මා සාමාන්‍ය පෙළ ලිව්වාටත් පසුවය.

අනෙක් සිනමා ශාලා දෙක වූයේ මාර්කට් වවුමේ පිහිටි නිව් විජේන්ද්‍රා ශාලාව හා මහජන පොළ අසල තිබූ විජේන්ද්‍රා ශාලාවයි. විජේන්ද්‍රා ශාලාව සම්පූර්ණයෙන්ම ටකරං තහඩුවලින් හිමිවා තිබූ අතර වහලයේ මුදුන් ලිය ඉසිලූ විශාල කණු ජෝඩියක් ශාලාව මැද දිගටම සිටුවා තිබුණි. බාධාවක් නොවී චිත්‍රපටය නැරඹීමට නම් කලින්ම ගොස් කණු අනුනොවන තැනක් අල්ලා ගැනීමට ප්‍රේක්ෂකයාට සිදුවිය.

10.30 හා 2.30 දර්ශන වලදී තහඩු ගින්දර මෙන් රත්වූ නිසා ප්‍රේක්ෂකයා එළියට ආවේ පෝරනුවෙන් එළියට එන උණු උණු පාන් මෙන් කරවී ඉගින් කණින් දහඩිය පොලූ හලාගෙනය. තහඩු බිත්තිවල තිබූ සිදුරුවලින් හිරු කිරණ ඇතුළට ගලා ආ අතර චිත්‍රපටය පැහැදිලිව නොපෙනුණි. ඊටත් එහි තිබූ ලෑලි පුටු මකුණන්ගේ තිප් බිම් වූ අතර සිගරට් දුමින් ඇස් හිලාකාර වුණි. ඒත් ප්‍රේක්ෂකයා කිසිදු මැසිවිල්ලකින් තොරව චිත්‍රපට නැරඹීම ප්‍රසංසා සහගතය. මෙම බේදනීය තත්වය නිසාම විජේන්ද්‍රා කාටු විජේන්ද්‍රා නමින් අනවර්ථ නාමයකින් හැඳින් විණි.

නිව් විජේන්ද්‍රා ශාලාවද ටකරංවලින්ම හිමිවා තිබුණද කාටු විජේන්ද්‍රාව හා සැසඳීමේදි ලකුණු කිහිපයකින් ඉදිරියෙන් සිටියාය.

ඉතිං සිත්තම්පලම් ශාලාවට ළඟා වූ අප බයිසිකලය සයිකල් ගාලේ නවතා පුවේශ පත් රැගෙන ශාලාව තුළට ගොස් අසුන් ගතිමු.

චිත්‍රපටය ඇරඹීමට තවත් කාල වේලාව තිබූ හෙයින් පසුබිමින් ඉතා මියුරු හින්දි චිත්‍රපට ගීත ප්‍රචාරය විය. තාත්තා අප අසලට ආ රට කජු කාරයාගෙන් මට රට කජු ගොට්ටක් අරං දුන්නේය. ඉන්පසු මම කජුවල රස බලමින් චිත්‍රපටය පටන් ගන්නා තෙක් නොඉවසිල්ලෙන් බලා සිටියෙමි.

හදිසියේම ක්‍රිං.... ගා සීනු හඬක් නිකුත්වූ අතර තාත්තා ඒ දෙවැනි බෙල් එක, ඊළඟ එක ගැහුවාම චිත්‍රපටය පටන් ගන්නවා යැයි ඒ හඬින් බියැවූ මා අස්වසා පැවසීය. කිව්වාත් මෙන් තවත් ක්‍රිං නාදයක් කිකුත් වනවාත් සමඟම ශාලාව අඳුරු වී තිරය මත රූප රාමු දිස්විය.

මුලින්ම ගිය ඩකමින්ඩ කෑලි මම මගත්සේ රස විඳිමි. තවත් ස්වල්ප වේලාවකින් මගේ ජීවිතයේ නැරඹූ

> ගාමිණී ෆොන්සේකා රැහේ මහා හූරා ධාරා ලෙසත්, ටෝනි රණසිංහ සිදාදියෙන් ගමට බඩ ගෑ වෙළෙන්දා ලෙසත් රඟන අයුරු මා කුල්මත් වූ දෑස් ආයාගෙන බලා සිටියෙමි. මා ළපටි කොලූවා වුවත් සුභා වෙළෙන්දා සමඟ ධාරා අතහැර පලා යද්දී මගේ හදවතට වැදුණ සුනිල් එදිරිසිංහයන් ගයන කුඩා ගමේ ගීතය තවමත් මගේ හදේ තැන්පත්ව ඇත්තේ ඒ දිනයේ දැනුණු අපූර්වත්වයෙන්මය.

මුල්ම සිනමා පටය හුලවාලි තිරය මත දිගහැරෙන්නට පටන් ගති.

ගාමිණී ෆොන්සේකා රැහේ මහා හූරා ධාරා ලෙසත්, ටෝනි රණසිංහ සිදාදියෙන් ගමට බඩ ගෑ වෙළෙන්දා ලෙසත් රඟන අයුරු මා කුල්මත් වූ දෑස් ආයාගෙන බලා සිටියෙමි. මා ළපටි කොලූවා වුවත් සුභා වෙළෙන්දා සමඟ ධාරා අතහැර පලා යද්දී මගේ හදවතට වැදුණ සුනිල් එදිරිසිංහයන් ගයන කුඩා ගමේ ගීතය තවමත් මගේ හදේ තැන්පත්ව ඇත්තේ ඒ දිනයේ දැනුණු අපූර්වත්වයන්මය. අවසන කොස්තා ධාරාට පිහියෙන් අහින දර්ශනයෙන් මා තිගැස්සුන නමුත් එදා චිත්‍රපට ශාලාවෙන් එළියට ආවේ චිත්‍රපට පිස්සෙකි.

එතැන් පටන් චිත්‍රපට නැරඹීමද චිත්‍ර කථා පත්තර බැලීම තරමටම ප්‍රියය කල මා චිත්‍රපට බැලීමට මුදල් ඉල්ලා ගත්තේ තාත්තා මධුවිත ටිකක් තොලගා මඳ පමණින් සිටින අවස්ථාවලදීය. එවිට තාත්තා නෑ බෑ නොකියා මුදල් දෙන බැව් මා අත්දැකීමෙන් දැන සිටීම මිට හේතුවයි. මුදල් සොයා ගත් පසු අප නිවසේ නතරව සිටි ඥාති සොයුරෙකු වූ උක්කූං අයියා සමඟ චිත්‍රපට නැරඹීමට මම හුරු වුණෙමි. පිච්ර් පිස්සෙකු වූ උක්කූං අයියා මේ නිකං ළඟෙන පිනා චාන්ස් එකට කිසිම විටෙක පස්සා ගැහුවේ නැත. මට මතක හැටියට එසේ බලාපු චිත්‍රපට අතර නීල් රූපසිංහයන්ගේ සරදියල්ගේ පුතා මගේ සිත තදින් පැහැරගත් සිනමා පටයකි. එහි වූ අයියාට අපි ආදරේ ගීතය මම මහත්සේ රස වින්දෙමි. මා ඇතුළු බොහෝ දෙනෙකු එම චිත්‍රපටිය බැලීමට ඇඳි ගිය එක්තරා ජවනිකාවක් තවමත් මගේ සිතේ ඇත. ඒ වූ කලි සරදියල්ගේ පුතා (ඇලෙක්සැන්ඩර් ෆනෑන්ඩො) වළක් තුළ සැබෑ වලසකු සමඟ අල්ලන ගුස්තියකි.

ඉන්පසු මඩොල්දූව නැරඹීමෙන් මම මනසින් නොදැන්නා දූපත් වල සැරිසැරුවෙමි. ටයි මගත්තයාගේ හඳයා නරඹා පෝතියෙකු මිලට ගැනුමට සිහින දැක්කෙමි.

චණ්ඩි පුතාගි ගාමිණීගේ රඟපෑමට වශී වුණෙමි. එහි වූ ලතා වල්පොල ගැයූ ශාන්ති ලේඛා රැඟූ අම්මලා දුක් ගන්නේ පුතුන් හඳන්වා පුතුන් රජුන් කරන්වා ගීතයට පෙම් බැන්දෙමි.

ඉන්පසු නැරඹූ දුලිකා, සිකුරුලියා හා ජනක සහ මංජු වැනි සිනමා පට මට අද මෙන් මතකය. සිකුරුලියාගී රඟපෑ අඟුටුමිටි නළුවා (බංදුල ගලගෙදර) අප නිවස පිහිටි පාරේම විසීමද විශේෂ කරුණකි. ඩී ප්‍රේමරත්නයන් සිකුරුලියා නිර්මාණය කරන ලදී.

මේ කාලය සිංහල සිනමාවේ ස්වර්ණම යුගය වූ අතර අවුරුද්ද පුරා විශාල වශයෙන් නව සිනමා පට නිකුත් විය. සිනමා ශාලා මිනිසුන්ගෙන් පිරී පැවතිණි.

අපේ තාත්තාද මා මෙන්ම චිත්‍රපට පිස්සකු හා නවකථා කියවීමේ රුසියෙකු විය. ගමේ කටු උල් කරන්න ඕනෑ නෑ කියූ කතාව සනාථ කරමින් මමද ඔහුගේ අඩි පාරේම ඇඳුණෙමි.

මම තුනේ පංතියේ ඉගෙන ගන්නා කාලයේ කවුද රජා චිත්‍රපටය නිකුත් විය. එහි රඟ පෑ සිනමාවේ සක්විති ගාමිණී ෆොන්සේකාගේ අති විශාල පෝස්ටරයක් තිව් විජේන්ද්‍රා සිනමා හල ඉදිරි පිට ඉදිවිය.

ඒ කාලයේ මෙම පෝස්ටර් නිර්මාණට කප් ගසා සිටියේ ටී පී මහින්දයි. ඔහු නාට්‍යවල රඟපෑ නළුවෙකුද විය.

ඔහු කවුද රජාට තැනූ විශාල පෝස්ටරය ඒ දිනවල ඇතිවූ සුළි සුළඟක් හේතුවෙන් කැඩී වැටී තිබෙනු මට අද මෙන් මතකය.

1983 ජූලි මාසයේ ඇවිලුණු ඒ ඊනියා ජාතිවාදී කෝලහලයේදී අන්තවාදී සිංහල පිරිස් විසින් දමිළ මහතුන් සතුව සිත්තම්පලම් හා නිව් විජේන්ද්‍රා යන සිනමා ශාලා අපට අහිමි කරවූහ. පොළ ළඟ තිබූ කාටු විජේන්ද්‍රාව පමණක් ඉතිරි විය. එයට හේතුවූ සැඟවුන කතාව පසුව හෙළිදරව් විණි.

විජේන්ද්‍රාවට අරක් ගත් පොළ ළඟ දරුණු රස්තියාදු කණ්ඩායමක් විය. වරෙක ඔවුන් විසින් අනුරාධපුරයට පැමිණි ජර්මන් ජාතික සංචාරක යුවලකට අඩමිතේරිටම් කොට ඒ සුදු කාන්තාව දූෂණය කිරීමට පවා සහසික විය. එම සිද්ධියෙන් පසු එම කණ්ඩායමේ ප්‍රබලයෝ කිහිප පොළක් අනුරාධපුරයෙන් පලා ගියහ. පසුව සමහරකු පොලිසියට කොටු වූහ.

තවත් වරක් චිත්‍ර පටියක් නැරඹීමට පැමිණි හමුදාවේ මහතෙකුගේ බිරිඳකට නොමනා විහිළුවක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එම මැර කණ්ඩායම හමුදාවෙන් කට බඩ පුරා කෑ අවස්ථාවක්ද දැන ගන්නට ලැබිණි.

ඉතිං මා මෙම සිද්ධීන් ඔබට මතක් කළේ ඔවුන්ගේ පාදඩකම හෙළිදරව් කිරීමටයි. මෙම මැර රැළ විසින් ඔවුන්ට සෙවණ දුන් විජේන්ද්‍රාව රැක ගෙන අතිකුත් සිනමා ශාලා විනාශ කල බැව් පසුව ප්‍රකිද්ධ රහසක් බවට පත් විය. මෑතක් වන තුරුම අනුරාධපුරයේ තිබුණේ කාටු විජේන්ද්‍රාවම පමණි. එය මා වැනි චිත්‍රපට පිස්සන්ට ගැසූ අතුල් පහරක්ම විය. දැන්නම් නවීන පන්නයේ සිනමා හල් කිහිපයක්ම අනුරාධපුරයේ ඇතිමුත් එදා විනාශ කල සිත්තම්පලම් හා නිව් විජේන්ද්‍රා ශාලා නැවත ගොඩ නැගුණේ නැත.

මතු සම්බන්ධයි

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com